# පොල් වගා කිරීමේ මණ්ඩලය - 2012

## 1 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට පොල් වගා කිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරන අඩුපාඩු

ගනුදෙනුවල නියැදි පරීක්ෂාවේදි අනාවරණය වූ රු.109,810,459 ක ගිණුම්කරන අඩුපාඩු මණ්ඩලයේ සභාපතවරයාගේ අවධානයට යොමු කරන ලද අතර එම අඩුපාඩු සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීම් කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 05 දින නැවත ඉදිරිපත් කරන ලදි. මේ අනුව නියැදියට පරිබාහිරව තවදුරටත් ගිණුම්කරන අඩුපාඩු නොතිබේය යන්න විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, එකතුව රු.484,818,000 ක් වූ රජයේ පුනරාවර්තන හා සෙස් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.2,207,368 ක ඌනතාවයක් වූ අතර, එයට එරෙහිව ඉකුත් වර්ෂයේ එකතුව රු.572,891,000 ක් වූ රජයේ පුනරාවර්තන හා සෙස් ප්‍රදානයන් ඇතුළු අනෙකුත් ප්‍රදානයන් ගණන් ගැනීමෙන් පසු අතිරික්තය රු.186,511,249 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 188,718,617 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට වඩා සෙස් ප්‍රදානය රු. මිලියන 96.5 කින් අඩුවීම හා සහනාධාර ගෙවීම් රු. මිලියන 277 කින් වැඩිවීම, මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 **විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.124,352,387 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී ශුද්ධ ලාභය රු.95,888,041 ක් හා සසඳන විට ලාභයේ වැඩිවීම රු.28,464,346 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පොහොර ඒකකය රු.1,236,868 ක අතිරික්තයක් ලබා තිබූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,172,797 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ කප්රුක ව්‍යාපෘතියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.38,744,009 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,209,457 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 28,534,552 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට වඩා ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.මිලියන 26.7 කින් වැඩිවීම හා පොලී ප්‍රතිදාන රු. මිලියන 3.6 කින් අඩුවීම, මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 **ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බාහිර පුද්ගලයන් 06 දෙනෙකු විසින් එකතුව රු.12,328,805 ක වන්දි ඉල්ලා මණ්ඩලයට එරෙහිව අධිකරණ වල නඩු 07 ක් ගොනුකර තිබුණි.

(ආ) මණ්ඩලය විසින් බාහිර ආයතන හා පුද්ගලයන් 04 දෙනෙකුට එරෙහිව එකතුව රු.3,144,651 ක වන්ද ඉල්ලා අධිකරණවල නඩු 04 ක් ගොනුකර තිබුණි.

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

3.1.1 **සහනාධාර ගෙවීම්**

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සහනාධාර ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කර තිබූ අතර, වර්ෂය අවසානයේදී සහනාධාර වැඩ සටහන් වල ඉලක්කය හා ප්‍රගතිය පහත පරිදි විය.

| සහනාධාර වැඩ සටහන | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පොල් නව / නැවත / යටි වගා සහනාධාර ක්‍රමය | පොල් පැල | 1,152,000 | 1,284,886 | 112 |
| පොල් ඉඩම් පුනරුත්ථාපනය | පොල් පැල | 400,000 | 236,631 | 59 |
| දිවිනැගුම වැඩ සටහන | පොල් පැල | 3,939,618 | 2,764,777 | 70 |
| කප්රුකයි සිප්නැණයි | පොල් පැල | 300,000 | 343,881 | 115 |
| සම්බුද්ධත්ව ජයන්ති වැඩ සටහන | පොල් පැල | 25,000 | 25,887 | 104 |
| ගවගාල් සහනාධාර වැඩ සටහන | ගවගාල් | 240 | 141 | 59 |
| වාරිමාර්ග සහනාධාර වැඩ සටහන | අක්කර | 750 | 507.5 | 68 |
| කප්රුක පුරවර වැඩ සටහන (ගෙවතු වගා සහනාධාරය) | පොල් පැල | 3,000,000 | 1,599,679 | 53 |
| කප්රුක ආයෝජන වැඩ සටහන | අක්කර | 3,100 | 2,169 | 70 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරුත්ථාපන සහනාධාර වැඩසටහන යටතේ පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් පොල් ඉඩම් වල පාළු සිටුවීම සඳහා පොල් පැල 400,000 ක් ලබා දීමට ඉලක්ක කර තිබුණත්, ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුළ පාළු සිටුවීම සඳහා පොල් පැල 236,631 ක් ලබා දී තිබුණි. ඒ අනුව, එහි භෞතික කාර්යසාධනය සියයට 59 ක් විය.

(ආ) පවතින පොල් ඉඩම් වලින් වැඩි නිෂ්පාදනයක් ලබාගැනීම, පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ අරමුණ වූ අතර ඒ වෙනුවෙන් පාංශු ඛාදනය අඩු කිරීම, තෙතමන සංරක්ෂණය කිරීම, පාළු සිටුවීම වැනි කෘෂි විද්‍යාත්මක කටයුතු සිදුකරයි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේ දී පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් පාළු සිටුවීම සඳහා පොල් පැල ලබාදීම පමණක් සිදුකර තිබුණි. මෙසේ පොල් පැල ලබාදීම තුළින් පමණක් පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම ප්‍රමාණවත් වී නොතිබුණි.

(ඇ) කප්රුක පුරවර ගෙවතු වගා සහනාධාර වැඩ සටහන යටතේ පොල් පැල 3,000,000 ක් බෙදා දීමට ඉලක්ක කර තිබූ අතර, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට පොල් පැල 1,599,679 ක් බෙදා දී තිබුණි. එහි භෞතික කාර්යසාධනය සියයට 53 ක් විය. නමුත්

ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී ප්‍රාදේශීය කාර්යාල 10 ක සියයට 25 ත් සියයට 49 ත් අතර පරාසයක අවම කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පොල් ඉඩම් අක්කර 750 ක් වෙනුවෙන් වාරිමාර්ග සහනාධාරය ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබුණ ද මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසාන වන විට අක්කර 507.5 ක් සඳහා මෙම සහනාධාරය ලබා දී තිබුණි. ඒ අනුව එහි භෞතික කාර්යසාධනය සියයට 68 ක් විය. නමුත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ කිසිදු කාර්ය සාධනයක් නොවූ අතර තවත් ප්‍රාදේශීය කාර්යාල 4 ක කාර්ය සාධනය සියයට 35 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඉ) පොල් ඉඩම් වල කාබනික පොහොර භාවිතය වැඩි කිරීම අරමුණු කර ගෙන සමාලෝචිත වර්ෂය තුළ ගව ගාල් 240 ක් ඉදිකිරීම සඳහා සහනාධාර ලබාදීමට ඉලක්ක කර තිබුණත්, මණ්ඩලයේ ප්‍රගති වාර්තා අනුව වර්ෂය අවසන් වනවිට ගව ගාල් 141 ක් ඉදිකිරීම සඳහා සහනාධාර ලබා දී තිබුණි. එහි භෞතික කාර්යසාධනය සියයට 59 ක් විය. නමුත් ප්‍රාදේශීය කාර්යාල මට්ටමෙන් පරීක්ෂා කිරීමේදී මාතර හා මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලවල කිසිදු කාර්ය සාධනයක් වාර්තා වී නොතිබුණු අතර තවත් ප්‍රාදේශීය කාර්යාල 6 ක කාර්ය සාධනය සියයට 35 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

3.1.2 <u>ආදර්ශ පොල් උයන්</u>

2012 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ලෙස වතු 12 ක් මණ්ඩලය විසින් කළමනාකරණය කර තිබුණි. උක්ත පොල් උයන් පිළිබඳ දත්තයන් කිහිපයක් පහත දැක්වේ.

| ආදර්ශ පොල් උයන | වගා කර ඇති භූමි ප්‍රමාණය අක්කර | ඵල දරන ගස් සංඛ්‍යාව | කඩන ලද පොල් ගෙඩි | වැටුණු පොල් ගෙඩි | වාර්ෂික අස්වැන්න ගෙඩි | වැටුණු පොල් % | ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි | අක්කරයකට ඵලදාව ගෙඩි |
|---|---|---|---|---|---|---|---|---|
| නාගන්සෝල | 347 | 15,274 | 528,319 | 293,232 | 821,551 | 36 | 54 | 2,368 |
| රත්දෙණිය | 311 | 13,519 | 470,932 | 309,168 | 780,100 | 40 | 58 | 2,508 |
| ලේනව | 481 | 20,975 | 829,064 | 131,586 | 960,650 | 14 | 46 | 1,997 |
| බෝපිටිය | 104 | 4,717 | 234,957 | 140,004 | 374,961 | 37 | 79 | 3,605 |
| ගර්ට්ලන්ඩ් | 388 | 14,385 | 606,716 | 396,873 | 1,003,589 | 40 | 70 | 2,587 |
| කොරෙයි | 173 | 5,423 | 262,235 | 40,448 | 302,683 | 13 | 56 | 1,750 |
| පාසිකුඩා | 47 | 3,123 | 281,583 | 27,745 | 309,328 | 9 | 99 | 6,595 |
| මහයාය | 290 | 11,448 | 679,393 | 385,011 | 1,064,404 | 36 | 93 | 3,670 |
| ඩේසිවැලි | 299 | 14,219 | 667,617 | 488,166 | 1,155,783 | 42 | 81 | 3,868 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මුන්දලම | 14 | 710 | 60,917 | 9,646 | 70,563 | 14 | 99 | 4,952 |
| කොහොඹාන | 82 | 3,776 | 297,309 | 105,205 | 402,514 | 26 | 107 | 4,909 |
| පලෙයි | 86 | 5,522 | 132,160 | 18,484 | 150,644 | 12 | 27 | 1,752 |
| **එකතුව** | **2,622** | **113,091** | **5,051,202** | **2,345,568** | **7,396,770** | **32** | **65** | **2,821** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2012 වර්ෂයේ මුළු පොල් එළදාව ගෙඩි මිලියන 7.39 ක් විය. එය ඉකුත් වර්ෂය හා සැසඳමේදී සියයට 17 ක වර්ධනයකි.

**(ආ)** පොල් පර්යේෂණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද "පොල් වගාව සඳහා පොහොර භාවිතය හා ඉඩම් යෝග්‍යතාවය "උපදේශක සඟරා අංක 1 හි පරිදි පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතාව එස් 1 සිට එන් 2 දක්වා යෝග්‍යතා පන්ති 7 කට වර්ගීකරණය කර තිබුණි. එහි තුන්වන පන්තිය වන "එස් 3- යෝග්‍ය " නමැති යෝග්‍යතා පන්තියට අනුව වසරකට පොල් වගා අක්කරයකින් ගෙඩි 4,048 - 5,060 අතර ප්‍රමාණයක පොල් එළදාවක් ලබාගත හැකි වුවත්, මණ්ඩලය මගින් නඩත්තු කරන ආදර්ශ පොල් උයන් 12 න් පාසිකුඩා, මුන්දලම, කොහොඹාන වතු හැර අනෙක් වතු මෙම මට්ටම ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ඇ)** ලේනව ආදර්ශ පොල් උයනේ ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 50 කට වඩා අඩුවෙන් පැවතුණි.

**(ඈ)** මහයාය, නාගන්සෝල, බෝපිටිය, රන්දෙණිය, ගර්ට්ලන්ඩ් හා ඩේසිවැලි යන ආදර්ශ පොල් උයන් 6 ක වැටුණු පොල් ප්‍රතිශතය සියයට 36 ත් සියයට 42 ත් අතර පරාසයක ඉතා ඉහළ අගයක් ගෙන තිබූ බැවින් එළදාව නෙළීම නිසි කලට සිදුවී නොතිබුණි.

3.1.3 <u>රෝග පාලනය</u>

වැලිගම කොළ කුණුවීමේ හා කොළ මැලවීමේ රෝගය පාලනය කිරීම සඳහා හඳුනාගෙන තිබූ එකම ක්‍රමවේදය වන රෝගී ගස් ගලවා ඉවත් කිරීමට අදාල කටයුතු වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනතේ 4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන විධාන පත්‍රය අනුව රෝගය හඳුනාගත් දින සිට දින 14 ක් තුළ රෝගී ගස් ගලවා විනාශ කිරීමට නිර්දේශ කර තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එසේ ගලවා ඉවත් කිරීමට නොහැකිව ප්‍රමාද වූ රෝගී ගස් ගණන 26,449 ක් වී තිබුණි.

රෝගී ගස් රෝගී කාලය තුළ මේ ආකාරයට ගලවා ඉවත් නොකර සිටීමෙන්, රෝග පාලනය සම්බන්ධයෙන් ගන්නා ලද මෙම ක්‍රියාමාර්ගයට අදාලව අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට නොහැකි වීමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.1.4 <u>කප්රුක පුරවර වැඩ සටහන යටතේ ප්‍රජා තවාන් පිහිටුවීම</u>

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගාල්ල සිට තංගල්ල දක්වා වූ රෝගී කලාපය තුළ වැලිගම කොළ කුණුවීමේ හා කොළ මැලවීමේ රෝගී තත්ත්වය පැවතුණි. අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ තව දුරටත් එම රෝග නොපවතින බවට අංක 1623/11 දරන 2009 ඔක්තෝබර් 14 දිනැති ගැසට් නිවේදනය පරිදි දන්වා නොතිබුණි. එම තත්ත්වයක් තුළ මණ්ඩලය විසින් එම ප්‍රදේශයේ පොල් වගාකරුවන් තෝරා ප්‍රජා තවාන් 14 ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 4 ක පිහිටුවා තිබුණි. ඒ අනුව උක්ත ගැසට් පත්‍රයේ 11 වන හා 12 වන නියෝගවලට පටහැනිව රෝගී කලාපය තුළ පොල් පැල නිෂ්පාදනය සිදුවීම තුළත් මෙම රෝග පාලන ක්‍රියාදාමයේ අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ප්‍රජා තවාන්වලට ලබාදෙන බීජ පොල් ප්‍රමාණයෙන් සියයට 70 ක පැල ලබාගත් පසු ප්‍රජා තවාන්වල ඉතිරි වන පොල් පැල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබීමෙන් රෝගී කලාපය තුළ පිහිටි මෙම ප්‍රජා තවාන්වලින් ඉතිරිවන පොල් පැල රෝගී කලාපය හා ආරක්ෂිත කලාපයෙන් පිටතට යාමේ අවදානමක් ද පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.1.5 <u>පොල් සංවර්ධන පුහුණු වැඩ සටහන</u>

පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මගින් එම මධ්‍යස්ථානය තුළ හා මධ්‍යස්ථානයේ මැදිහත්වීමෙන් හා අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය කාර්යාල හරහා පුහුණු වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දි පුහුණු මධ්‍යස්ථානය තුළ පවත්වන ලද වැඩසටහන් 15 කින් වැඩසටහන 3 ක කාර්ය සාධනය සියයට 60 ක් වූ අතර මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය කාර්යාල මගින් ක්‍රියාත්මක කර තිබූ දැනුවත් කිරීමේ වැඩ සටහන් 3 අතුරෙන් පාසල් හා ග්‍රාමීය සංවිධාන සඳහා වූ දැනුවත් කිරීමේ වැඩ සටහන් 2 ක ප්‍රගතිය පිළිවෙලින් සියයට 55 හා සියයට 62 ක් විය.

3.2 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු ප්‍රමාණය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 03 | 02 |
| තෘතියික මට්ටම | 44 | 16 | 28 |
| ද්විතියික මට්ටම | 725 | 417 | 308 |
| ප්‍රාථමික මට්ටම | 151 | 107 | 44 |
| | 925 | 543 | 382 |

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාලවන තනතුරු 382 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවල ආදර්ශ පොල් උයන් ඒකකය, තවාන් ඒකකය, බීජ නිෂ්පාදන ඒකකය යන ඒකක ස්වයං මූල්‍ය ඒකක ලෙස හඳුනා ගෙන තිබූ අතර එමගින් සමාලෝචිත වර්ෂය තුළ රු.995,603,000 ක ආදායමක් උපයා ගැනීමට ඉලක්ක කර තබුණි. එසේ එක් එක් ඒකක විසින් උපයා ගැනීමට සැලසුම් කර තිබූ ආදායම වෙන වෙනම දක්වා තිබුණද එම ආදායම් උපයා ගන්නා ආකාරය පිළිබඳ විස්තරාත්මක තොරතුරු අයවැය ඇස්තමේන්තු තුළ අන්තර්ගත වී නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මානව සම්පත් කළමනාකරණය

(ඇ) පොල් සංවර්ධන පුහුණු වැඩ සටහන

(ඇ) ගබඩා කාර්ය පරිපාටිය

(ඉ) තවාන් කළමනාකරණය

## (ඊ) වතු කළමනාකරණය